සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 34 S I

විද්‍යාව | කාලය පැය දෙකයි

I කොටස | ● සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01.ජීවී හා අජීවී ද්‍රව්‍ය පිළිවෙලින් දැක්වෙන්නේ කවර පිළිතුරේද?
 01. දළඹුවා - මකුළුවා  02. සමනලයා - ගිනිමැලය  03. පිදුරු - පොකුණු ජලය  04. මී වදය - මී මැස්සා

02. කොළ පැහැතිය, ස්වයංපෝෂී වේ, ස්වසනය කරයි, වර්ධනය වේ, වර්ගයා බෝ කරයි. ඉහත ලක්ෂණ සියල්ල අයත් ජීවියා වන්නේ,
 01. තණකොළ පෙත්තා  02. ගොයම් මැස්සා  03. ගොයම් ගස  04. ගිරවා


03. කාබන්ඩයොක්සයිඩ් වායුව,
 01. ජීවීන්ගේ ශ්වසනයට අවශ්‍යයි.  02. ද්‍රව්‍ය දහනයට අවශ්‍යයි.
 03. අවර්ණ හුණු දියර කිරි පැහැ ගන්වයි.  04. ජීවීන්ගේ ස්වසනයට හා ද්‍රව්‍ය දහනයට අවශයයි.

04. සර්වභක්ෂක සතුන් පමණක් සහිත පිළිතුර තෝරන්න.
 01. නයා, ගෙම්බා, රිලවා  02. කපුටා, කුකුළා, වලහා
 03. කපුටා, මිනිසා, දිවියා  04. නරියා, ගිරවා, පොළගා


05. පැන්ඩා යන සත්ත්වයා වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇත්තේ,
 01. චීනයේ පමණක් ජීවත් වන නිසා
 02. පැටවුන් බෝ වීමේ වේගය අඩු නිසා
 03. සුරතල් පෙනුම හේතු කොටගෙන මිනිස් ග්‍රහණයට හසු වීම නිසා
 04. එකම ශාක ද්‍රව්‍යයක් මත පමණක් යැපීම නිසා

06. පොසිල ඉන්ධන වල අඩංගු වන්නේ,
 01. තාප ශක්තියයි  02. ධ්වනි ශක්තියයි  03. සූර්යය ශක්තියයි  04. සුළං ශක්තියයි.

07. වර්ෂාවකදී පොළොවට පතිතවන ජලයේ හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා සකස් කළ ඇටවුමක් පහත දැක්වේ. මෙහි A,B,C සමාන කළ හැක්කේ පිළිවෙලින්,





 01. වර්ෂණය, මතුපිට ජලය, භූගත ජලයටයි.
 02. මතුපිට ජලය, වර්ෂණය, භූගත ජලයටයි.
 03. භූගත ජලය, වර්ෂණය, මතුපිට ජලයටයි.
 04. භූගත ජලය, මතුපිට ජලය, වර්ෂණයයි.




08. සර්ව සම බඳුන් තුනකට කරදිය, මිරිදිය හා කිවුල්දිය සමාන පරිමා වලින් දමා අව්වේ තබන ලදි. ජලය සම්පූර්ණයෙන් සිඳී ගිය පසු A හි කිසිවක් දක්නට නොලැබුණි. B හි සණකම සුදු පැහැ කුඩක්ද, C හි ඉතා තුනී සුදු කුඩු ස්ථරයක්ද දැකගත හැකි විය. A,B,C විය හැක්කේ පිළිවෙලින්,
 01. කරදිය, කිවුල්දිය හා මිරිදිය  02. මිරිදිය, කරදිය හා කිවුල්දිය
 03. මිරිදිය, කිවුල්දිය හා කරදිය  04. කිවුල් දිය, කරදිය හා මිරිදිය

09. රූපයේ දක්වා ඇති සංගීත භාණ්ඩය වන්නේ,
 01. සෙක්සෆෝනයයි  02. ට්‍රම්පටයයි
 03. වයලීනයයි  04. සයිලෆෝනයයි




10. ගොක්කොළ නලාවකින් ශබ්දය ඇති කරන ආකාරය මෙන් ශබ්දය ඇතිවන සංගීත භාණ්ඩය,
 01. සර්පිනාව  02. ගිටාරය  03. සිතාරය  04. දවුල

11. ඝණ, ද්‍රව, වායු අවස්ථා තුනෙහිම දැකිය හැකි පදාර්ථ යුගල වන්නේ,

01. පොල්තෙල් හා විනාකිරි
02. ජලය හා ඉටි
03. විනාකිරි හා ජලය
04. ඉටි හා විනාකිරි


12. නිදහසේ එල්ලන ලද චුම්බක දෙකක් එකිනෙකට ලංකල අවස්ථා තුනක් A,B,C ලෙස දැක්වේ.




A,B,C හි දැකිය හැකි නිරීක්ෂණ වන්නේ පිළිවෙලින්,

01. විකර්ෂණය, විකර්ෂණය, ආකර්ෂණය
02. ආකර්ෂණය, විකර්ෂණය, විකර්ෂණය
03. ආකර්ෂණය, ආකර්ෂණය, විකර්ෂණය
04. විකර්ෂණය, ආකර්ෂණය හා විකර්ෂණය




13. ජෝගුවේ තිබූ ජලය සම්පූර්ණයෙන්ම වීදුරුවට වත්කළ පසු,





01. ජලයේ හැඩය වෙනස් වේ.
02. ජලයේ පරිමාව වෙනස් වේ.
03. ජලයේ ස්කන්ධය වෙනස් වේ.
04. ජලයේ පවතින අවස්ථාව වෙනස් වේ.

14. ඩයෝඩයක සම්මත සංකේතය වනුයේ,

01. 

02. 
03. 
04. 

15.





ඉහත කුමන් අවස්ථාවේ බල්බය නොදැල්වේ ද?

01. A
02. B
03. C
04. D

16. තාපය හේතු කොට ඇතිවන වර්ණ විපර්යාසයකි.


01. රත් කරන විට යකඩ කැබැල්ලක පැහැය වෙනස් වීම.
02. ගස්වල පත්‍ර කහ පැහැයට හැරීම.
03. මුහුදේ ජලය නිල්පාට වීම.
04. අව්වේ සිටින විට සම කළු වීම.

17. කුඩා ලෝහ ගෝලයක් රූපයේ දැක්වෙන පරිදි කම්බියකින් එල්ලා ඇත. කම්බිය ටික වේලාවක් රත් කරන විට ලෝහ ගෝලය පොළොව හා ස්පර්ශ විය. මීට හේතුව වන්නේ,




01. රත් කිරීම නිසා ලෝහ ගෝලය බරින් වැඩි වීම
02. තාපය නිසා ලෝහ ගෝලය පහලට තල්ලු වීම.
03. තාපය නිසා කම්බිය ප්‍රසාරණය වී දිගින් වැඩිවීම.
04. තාපය නිසා ලෝහ ගෝලය ප්‍රසාරණය වීම.

18. A,B හා C උපකරණ වන්නේ පිළිවෙළින්,




01. වර්ෂාමානය, සුළං දිශා දර්ශකය, අනිලමානය
02. වර්ෂාමානය, අනිලමානය, සුළං දිශා දර්ශකය
03. සුළං දිශා දර්ශකය, අනිලමානය, වර්ෂාමානය
04. අනිලමානය, වර්ෂාමානය, සුළං දිශා දර්ශකය

19. තෙත් කලාපයට අයත් නොවන ප්‍රදේශයක් වන්නේ,

01. රත්නපුර
02. ගම්පහ
03. හැටන්
04. අම්පාර

20. විදුලි පරිපථ හා උපාංග ජලය ඇති ස්ථාන වල භාවිතා නොකළ යුත්තේ,


01. ලිස්සා වැටී අනතුරු ඇතිවිය හැකි නිසා
02. ජලය තුළින් විදුලිය සන්නයනය වී අනතුරු ඇතිවන නිසා
03. ජලය ඇතිවිට පරිපථ අක්‍රිය වන නිසා
04. විදුලි උපාංග මළ කෑමට ලක්වන නිසා

## II කොටස

**A කොටසේ ප්‍රශ්න අනිවාර්යය වේ. B කොටසින් ප්‍රශ්න 4ක් ඇතුළු ප්‍රශ්න 6කට පිළිතුරු සපයන්න.**

**A කොටස (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න)**

01. (A) ශක්ති ප්‍රභවයකින් ප්‍රයෝජනවත් කාර්යයක් ඉටුකර ගැනීමට 6 ශ්‍රේණියේ සිසු පිරිසක් සකස් කළ අටවුමක් පහත දැක්වේ.




i. ඉහත නිර්මාණයේ A සඳහා භාවිතා කළ හැකි ද්‍රව්‍යයක් නම් කරන්න. (ල. 01)

..........................................................................................................................................................

ii. ඉහත නිර්මාණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ශක්ති ප්‍රභවය කුමක්ද? (ල. 01)

..........................................................................................................................................................

iii. මෙම නිර්මාණයේ විද්‍යුත් ශක්තිය උපදවා ගැනීමට B සඳහා භාවිතා කළ හැක්කේ කුමක්ද? (ල. 01)

..........................................................................................................................................................

iv. මෙය ක්‍රියාත්මක වන විට විද්‍යුත් ශක්තිය නිපදවෙන බව හඳුනා ගන්නේ කෙසේද? (ල. 01)

..........................................................................................................................................................

v. විදුලිය නිපදවෙන බව ශ්‍රවණය කිරීම මගින් හඳුනා ගැනීම සඳහා ඉහත නිර්මාණයේ E වෙනුවට යෙදිය හැකි දෙයක් නම් කරන්න.

..........................................................................................................................................................(ල. 01)

vi. ශ්‍රී ලංකාවේ විදුලිය උත්පාදනය සඳහා ගල් අඟුරු දහනය මගින් ශක්තිය ලබා ගන්නා විදුලි බලාගාරය නම් කරන්න.

.......................................................................................................................................................... (ල. 01)

**(B)** 6 ශ්‍රේණියේ සිසුවකු විසින් මුං බීජ පැළ කර සති දෙකක් පුරා සිදු කළ නිරීක්ෂණය පහත සටහනේ දැක්වේ.




i. ශිෂ්‍යයා විසින් මෙම ක්‍රියාකාරකම සිදු කළේ ශාකයක කවර ජීවී ලක්ෂණයක් පෙන්නුම් කිරීමටද?................................................... (ල. 01)

ii එම ජීවී ලක්ෂණය පෙන්වීම සඳහා ඔහුට භාවිත කළ හැකි මිනුම් 2ක් ලියා දක්වන්න. ........................... .................................... (ල. 02)

iii. ශාකවල දක්නට නොමැති සතුන් පමණක් පෙන්වනු ලබන ජීවී ලක්ෂණයක් සඳහන් කරන්න. .................................................... (ල. 01)

02. 6 ශ්‍රේණියේ සිසුවකු වන සමන් යෝගට් කෝප්පයක් රබර් පටලයකින් වසා තනා ගත් කුඩා රබානක් රූපයේ දැක්වේ. කඩදාසි කැබලි කිහිපයක් රබර් පටලය මත තබා එය වාදනය කරන ලදි.



i. මෙම රබාන වාදනය කරන විට සමන් විසින් සිදු කරන්නට ඇති නිරීක්ෂණ දෙකක් ලියන්න.

..........................................................................................................................................................(ල. 02)

ii. මෙම ක්‍රියාකාරකමෙන් එළඹිය හැකි ධ්වනි උත්පාදනය හා සම්බන්ධ නිගමනය කුමක්ද?

..........................................................................................................................................................(ල. 01)

iii. ස්වභාවික ධ්වනි ප්‍රභවයක් හා කෘතිම ධ්වනි ප්‍රභවයක් නම් කරන්න.

ස්වභාවික :- ................................ කෘතිම :- ............................... (ල. 02)

iv. මිනිසාගේ ධ්වනිය සඳහා සංවේදී ඉන්ද්‍රිය නම් කරන්න.

..........................................................................................................................................................(ල. 01)


v. අධික ශබ්ද වලින් එම ඉන්ද්‍රියට වන හානි වලක්වා ගැනීමට සිදු කළ හැකි දෙයක් සඳහන් කරන්න.
........................................................................................................................ (ල. 01)

vi. සංගීත නාදයක් යනු කුමක්ද?
........................................................................................................................ (ල. 01)

vii. ඝෝෂාවක් සංගීත නාදයකින් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.
........................................................................................................................ (ල. 02)

**B කොටස ( තෝරා ගත් ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.)**

03.





A). ආලෝකය පිළිබඳ සිසුන් කළ ක්‍රියාකාරකමක් රූපයේ දැක්වේ. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. මෙම ක්‍රියාකාරකමේ භාවිත කළ ආලෝක ප්‍රභවය කුමක්ද? (ල. 01)
ii. මෙම රූප සටහනේ දක්නට ලැබෙන දීප්ත වස්තුවක් හා අදීප්ත වස්තුවක් බැගින් නම් කරන්න. (ල. 02)
iii. ඉහත A,B අවස්ථා දෙකෙහි යොදා ගන්නා රබර් බට දෙකෙහි හැඩයේ වෙනස කුමක්ද? (ල. 01)
iv. A අවස්ථාවේ සිසුන්ගේ නිරීක්ෂණය කුමක්ද? (ල. 01)
v. B අවස්ථාවේ ලී මීටර් රූලක් භාවිත කලේ ඇයි. (ල. 01)
vi. B අවස්ථාවේ සිසුන්ගේ නිරීක්ෂණය විය හැක්කේ කුමක්ද? (ල. 01)
vii. ඉහත ක්‍රියාකාරකමේ සිදුකර ඇත්තේ ආලෝකයේ කවර ලක්ෂණය පරික්ෂා කිරීමටද? (ල. 01)
viii. ආලෝක කිරණ සමූහයක් හඳුන්වන නම කුමක්ද? (ල. 01)
ix. ආලෝක කිරණයක හා ආලෝක කිරණ සමූහයක රූප සටහන් ඇඳ දක්වන්න. (ල. 02)


B). තාපය හා එහි බලපෑම් සොයා බැලිම් සඳහා සිසුන් දෙපිරිසක් සිදු කළ ක්‍රියාකාරකම් දෙකක් AහාB රූප වලින් දැක්වේ.

A පරීක්ෂණය B පරීක්ෂණය




i. A පරීක්ෂණයේ දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක්ද? (ල. 01)
ii. A මඟින් අධ්‍යනය කිරීමට බලාපොරොත්තු වන්නේ ජලයේ කුමන ගුණයක්? (ල. 01)
iii. A පරීක්ෂණයේ පාට කළ ජලය වෙනුවට පොල්තෙල් යොදා ගන්නේ නම් ඔබ ඉහත සඳහන් කළ පරීක්ෂණයේ ඇති වන වෙනස කුමක්ද? (ල. 01)
iv. B ක්‍රියාකාරකමට අනුව ජලයේ අවස්ථා විපර්යාසය ලියන්න. (ල. 01)

04. (A)




(ල. 01)
(ල. 01)
(ල. 01)

(I) පෘථිවි පෘෂ්ඨයෙන් විශාල ප්‍රතිශතයක් ජලයෙන් වැසී ඇති නමුත් ඉන් පරිභෝජනයට ගත හැක්කේ සීමිත ජල ප්‍රමාණයකි. ඉහත වට ප්‍රස්ථාරයේ දක්වා ඇත්තේ පෘථිවි පෘෂ්ඨයේ ජලය පවතින ආකාරයයි.


i. සාගර හා මුහුදු වල අඩංගු ජලය කෙසේ හැඳින්වේද? (ල. 01)
ii. එම ජලය ලුණු රස වීමට හේතුව කුමක්ද? (ල. 01)
iii. අධික ශක්තියෙන් යුතු මුහුදු රළ හඳුන්වන නම කුමක්ද? (ල. 01)

iv. මෙහි B ලෙස දක්වා ඇත්තේ ඝණ අවස්ථාවේ ඇති ජලයයි. ඝණ අවස්ථාවේ ඇති ජලය සඳහා උදාහරණ දෙකක් ලියන්න. (ල. 02)

v. මානව කටයුතු සඳහා ජලය භාවිතා කරන ක්ෂේත්‍ර දෙකක් ලියන්න. (ල. 02)

vi. ජලය දූෂණය වන ආකාරයක් සඳහන් කරන්න. (ල. 01)

(B) i. පහත රූපයේ පරිදි නිදහසේ එල්ලා ඇති දණ්ඩ චුම්බකයක් අසලට විවිධ වස්තූන් ලංකල විට ලද නිරීක්ෂණ පහත දැක්වේ.




A - ලංකල සෑම විටම එල්ලා ඇති දණ්ඩ චුම්බකය වස්තුව දෙසට ඇදී යයි.

B - ලංකල සෑම විටම එල්ලා ඇති දණ්ඩ චුම්භකය චලනය නොවේ.


C - ලංකල විට එල්ලා ඇති දණ්ඩ චුම්භකය ඇතැම් විට වස්තුව දෙසට ඇදී එයි. ඇතැම් විට වස්තුවෙන් ඉවතට ඇදී යයි.

ඒ අනුව A,B,C ආකාරයේ නිරීක්ෂණ ලබා දෙන වස්තූන් පහත ලැයිස්තුවෙන් තෝරා වගුවේ පුරවන්න.
(යකඩ කැබැල්ල, මකන කැබැල්ල, පිත්තල යතුර, චුම්බක කැබැල්ල, යකඩ ඇණය)

| A | B | C |
|---|---|---|
| | | |

(ල. 05)


ii. පහත රූපයේ දැක්වෙන චුම්භකයට ඇල්පෙනෙති ආකර්ෂණය වී ඇති ආකාරයයි.




a චුම්භකයේ වැඩි වශයෙන් යකඩ ඇණ ආකර්ෂණය වී ඇති ස්ථාන කුමන නමකින් හඳුන්වයිද? (ල. 01)

b එම ස්ථාන වල වැඩිපුර ඇල්පෙනෙති ආකර්ෂණය වීමට හේතුව කුමක්ද? (ල. 01)

**05.** (A) පහත දක්වා ඇත්තේ සරල කෝෂයක සටහනකි.





i. මෙහි A තහඩුව සඳහා යොදාගත හැකි තහඩුවක් ලියන්න. (ල. 01)

ii. A හා කොපර් තහඩු තනුක සල්ෆියුරික් අම්ලය තුළ බහාලූ වහාම දැකිය හැකි නිරීක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

iii. මෙහි තනුක සල්ෆියුරික් අම්ලය වෙනුවට භාවිතා කළ හැකි වෙනත් ද්‍රව්‍යයක් ලියන්න. (ල. 01)

iv.




ඉහත A,B,C හා D සංකේත වලින් දැක්වෙන විදුලි උපාංග මොනවාදැයි ලියා දක්වන්න. (ල. 04)

v. රසායනික කෝෂ වර්ග කළ හැකි ප්‍රධාන ආකාර 02 ලියා එක් එක් වර්ගය සඳහා උදාහරණ 01 බැගින් ලියන්න.

(B) පහත වගන්ති හරි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද පිළිතුරු පත්‍රයේ අදාළ අංකය ඉදිරියෙන් යොදන්න.

i. ඉතා කුඩා ධාරාවක් මැන ගැනීමට ගැල්වනෝමීටරය භාවිතා කළ හැකිය. ( )

ii. පරිපථයකට ඇමීටරයක් සවි කිරීමේදී එහි ධන අග්‍රය කෝෂයේ ඍණ අග්‍රය පැත්තට සම්බන්ධ කළ යුතුය. ( )


iii. ඇතැම් ගණක යන්ත්‍ර වල විදුලිය සැපයීමට සූර්යය කෝෂ ඇතුළත් කර ඇත. ( )

iv. තඹ හොඳ පරිවාරක ද්‍රව්‍යයකි. ( )

v. ඩයෝඩය සරල ඉලෙක්ට්‍රෝනික උපාංගයකට උදාහරණයකි. ( )

(ල. 05)

06. (A)




i. ඉහත රූප සටහන හැදින්වීමට භාවිතා කරන නම කුමක්ද? (ල. 01)
ii. ඉහත සටහන පදනම් කර ගනිමින් පුරුක් 03ක ආහාර දාමයක් ලියා දක්වන්න. (ල. 02)
iii. මෙම සටහනේ නිෂ්පාදකයා වන්නේ කවුද? (ල. 01)
iv. එම ජීවියා නිෂ්පාදකයා ලෙස සැලකීමට හේතුව කුමක්ද? (ල. 01)
v. ඉහත සටහනේ හමුවන ශාක භක්ෂකයෙකු හා මාංශ භක්ෂකයෙකු නම් කරන්න. (ල. 02)
vi. නිෂ්පාදකයින් හැරුණු විට අනෙකුත් සතුන් හැදින්විය හැකි පොදු නම කුමක්ද? (ල. 01)
vii. සිංහයා විනාශ කළහොත් පරිසරයේ වැඩිවේ යැයි අපේක්ෂා කළ හැක්කේ කුමන ජීවින්ද? (ල. 01)
viii. මෙවැනි අන්තර් ක්‍රියා නිසා ඉටුවන වැදගත් පාරිසරික මෙහෙය කුමක්ද? (ල. 01)

(B) පහත දෙබෙදුම් සුචිය සම්පූර්ණ කිරීම සඳහා a,b,c,d,e සඳහා යෙදිය යුතු පද සඳහන් කරන්න.

පොල්ගස, කොස් ගස,මිරිස් ගස, මීවන ශාක,

පුෂ්ප හටගනී | පුෂ්ප හට නොගනී

පොල්ගස, මිරිස් ගස, කොස් ගස | a) ........................

කඳ අතු බෙදී ඇත | කඳ අතු බෙදී නැත


b) ........ කොස් ගස | c) ........................

d) ......................... | ඵලයේ කටු නැත

e) .........................

(ල. 05)

07. (A) මහනුවර නගරයේ කාලගුණය සම්බන්ධව ජංගම දුරකතන තිරයකින් ලබා ගත් තොරතුරක් පහත සයහනේ දැක්වේ.



$26^0$

i. මේ තොරතුරු අනුව නගරයේ කාලගුණික තත්ත්වය විස්තර කරන්න. (ල.02)
ii. ඉහත කාලගුණ තොරතුරේ සඳහන් කාලගුණික සාධක දෙක සඳහන් කර එක් එක් සාධකය මනිනු ලබන ඒකකයක් බැගින් ලියා දක්වන්න. (ල.04)
iii. ඉහත කාලගුණික තත්වය දිගින් දිගටම පැවතිය හොත් ඇතිවිය හැකි ආපදා තත්වයන් දෙකක් ලියන්න (ල.02)
iv. එම එක් එක් ආපදාව මඟින් ඇතිවිය හැකි හානි අවම කරගත හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න. (ල.02)

(B) සිසුන් පිරිසක් විද්‍යාගාරයේදී A,B,C යන ද්‍රව්‍ය තුනක් සම්බන්ධව සිදු කළ නිරීක්ෂණ පහත පරිදි වගුවක දැක්වූහ.

| ද්‍රව්‍යය | හැඩය | පරිමාව |
|---|---|---|
| A | නිශ්චිත හැඩයක් ඇත. | නිශ්චිත පරිමාවක් ඇත. |
| B | නිශ්චිත හැඩයක් නැත. | නිශ්චිත පරිමාවක් ඇත. |
| C | නිශ්චිත හැඩයක් නැත. | නිශ්චිත පරිමාවක් නැත. |

මෙහි A,B,C සඳහා යෙදාගත හැකි ද්‍රව්‍ය සඳහා උදාහරණය බැගින් ලියන්න. (ල.03)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## විද්‍යාව - පිළිතුරු පත්‍රය

## 06 ශ්‍රේණිය

I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. 2 | 05. 4 | 09. 4 | 13. 1 | 17. 3 | |
| 02. 3 | 06. 3 | 10. 1 | 14. 2 | 18. 2 | |
| 03. 3 | 07. 1 | 11. 2 | 15. 4 | 19. 4 | |
| 04. 2 | 08. 2 | 12. 4 | 16. 1 | 20. 2 | (ලකුණු 1x20=20) |

II කොටස


A කොටස

01. A (i) ජල රෝදයක්/ සුළං රෝදයක් (ලකුණු 01)
(ii) ජල පහරක්/ සුළඟ (ලකුණු 01)
(iii) මෝටරයක් (ලකුණු 01)
(iv) විදුලි බුබුල දැල්වීම මඟින් (ලකුණු 01)
(v) විදුලි සීනුවක්/ සුහ පැතුම් පතක පරිපථයක් (ලකුණු 01)
(vi) නොරොච්චොලේ (ලකුණු 01)

B (i) වර්ධනය (ලකුණු 01)
(ii) ශාකයේ උස/ පත්‍ර සංඛ්‍යාව/ මුලේ දිග (ලකුණු 02)
(iii) සංචරණය (ලකුණු 01)

02. (i) කඩදාසි කැබලි කම්පනය වීම/ රබානෙන් හඬක් නිකුත් වීම (ලකුණු 02)
(ii) ධ්වනි උත්පාදනය සඳහා කම්පනයක් සිදු කිරීම අවශ්‍ය බව (ලකුණු 01)
කම්පන නිසා ධ්වනිය උත්පාදනය වන බව
(iii) ස්වාභාවික - දිය ඇල්ලක්/ වැස්ස/සුළඟ/ ගල් පෙරළීම, සත්ත්ව නාද වැනි ඕනෑම පිළිතුරක්
කෘත්‍රිම - බෙරය/ වයලීනය වැනි වාද්‍ය භාණ්ඩ ඇතුළු මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු විය හැකි ඕනෑම පිළිතුරක් (ලකුණු 02)
(iv) කන (ලකුණු 01)
(v) කන් ආරක්ෂක පැළඳීම (ලකුණු 01)
(vi) රිද්මයානුකූල ගායනයක් හෝ වාදනයක් (ලකුණු 01)
(vii) ඝෝෂාවක් සංගීත නාදයක් මෙන් රිද්මයානුකූල නැත. එසේම එය අවිධිමත් ශබ්දයකි. පීඩාකාරී විය හැකිය
(ලකුණු 02)

B කොටස

03. A (i) ඉටි පන්දම් දැල්ල (ලකුණු 01)
(ii) දීප්ත - ඉටිපන්දම් දැල්ල (ලකුණු 02)
අදීප්ත - රබර් පටිය/ මීටර් රූල/ ඉටිපන්දම (ලකුණු 01)
(iii) A- රබර් බටය වක්‍රව තිබේ. B - රබර් බටය ඍජුව තිබේ. (ලකුණු 01)
(iv) ඉටි පන්දම් දැල්ල නොපෙනේ. (ලකුණු 01)
(v) රබර් බටය ඍජුව තබා ගැනීමට හා ආධාරකයක් ලෙස (ලකුණු 01)
(vi) ඉටිපන්දම් දැල්ල පෙනේ. (ලකුණු 01)
(vii) ආලෝකය සරල රේඛීයව ගමන් කරන බව (ලකුණු 01)
(viii) ආලෝක කදම්බය
(ix)
ආලෝක කිරණය  ආලෝක කදම්බය 
(ලකුණු 02)

B (i) පාටකළ ජලය පැන් බටය දිගේ ඉහළට යයි. (ලකුණු 01)
(ii) ජලයේ ප්‍රසාරණය/ ප්‍රසාරණ ගුණය (ලකුණු 01)
(iii) පොල්තෙල් ජලයට වඩා වේගයෙන් පැන් බටය දිගේ ඉහළ යයි. (ලකුණු 01)
(iv) අයිස් කැට → ජලය (ලකුණු 01)

04. A (i) කරදිය (ලකුණු 01)
(ii) එහි සෝඩියම් ක්ලෝරයිඩ් ලවණ වර්ගය දියවී තිබීම (ලකුණු 01)
(iii) සුනාමි (ලකුණු 01)
(iv) ග්ලැසියර/ හිම/ අයිස් ආදියෙන් 02 ක් (ලකුණු 02)
(v) කෘෂිකර්මාන්තය/ සනීපාරක්ෂාව/ ගෘහස්ථ කටයුතු/ ප්‍රවාහන මාධ්‍යයක්/ විනෝදාස්වාදය/ ජල ක්‍රීඩා/ ජල විදුලිය නිපදවීම යනාදියෙන් 02 ක් (ලකුණු 02)
(vi) කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය බැහැර කිරීම/ ගෘහස්ථ කැලිකසල ජලයට දැමීම/ පොලිතීන් ප්ලාස්ටික් ජලයට මුදා හැරීම/ රසායනික ද්‍රව්‍ය/ විවිධ සේදුම්ද්‍රව්‍ය ජලයට එකතු වීම/ කෘෂි රසායනයන් එකතු වීම වැනි සුදුසු පිළිතුරක් සඳහා (ලකුණු 01)

B (i)

| A | B | C |
|---|---|---|
| යකඩ කැබැල්ල<br>යකඩ ඇණය | මකන කැබැල්ල<br>පිත්තල යතුර | චුම්බක කැබැල්ල |

(ලකුණු 05)

(ii) a ධ්‍රැව (ලකුණු 01)
b චුම්බක ගුණ වැඩි වශයෙන් පිහිටා ඇති නිසා (ලකුණු 01)

05. A (i) සින්ක්/ තුත්තනාගම් (ලකුණු 01)
(ii) කොපර් තහඩුව අසලින් වායු බුබුළු පිට වේ/ බල්බය දැල්වේ. (ලකුණු 02)
(iii) ලුණු ද්‍රාවණය/ දෙහි ගෙඩියක් (ලකුණු 01)
(iv) A- ගැල්වනෝ මීටරය B- බල්බය C- වියළි කෝෂය D- ස්විචය (ලකුණු 02)
(v) ප්‍රාථමික - වියළි කෝෂ/ ඔරලෝසු බැටරි/ කැමරා බැටරි
ද්විතියික කෝෂ - ඊයම් අම්ල ඇකි යුම්ලේටරය/ ජංගම දුරකථන බැටරි/ ඇතැම් විදුලි පන්දම් බැටරි (ලකුණු 04)

B (i) ✓ (ii) X (iii) ✓ (iv) X (v) ✓ (1x5=05)

06. A (i) ආහාර ජාලය → → (ලකුණු 01)
(ii) තණකොළ → ගවයා → සිංහයා (ලකුණු 02)
තණකොළ → මුවා → සිංහයා
තණකොළ තණකොළපෙත්තා ගෙම්බා මේවායින් ඕනෑම එකකට (ලකුණු 01)
(iii) තණකොළ
(iv) තමා විසින්ම ආහාර නිෂ්පාදනය කරන නිසා/ ප්‍රභාසංස්ලේෂණය කරන නිසා (ලකුණු 01)
(v) ශාක භක්ෂකයෙක් - ගවයා/ මුවා/ තණකොළපෙත්තා (ලකුණු 01)
මාංශ භක්ෂකයෙක් - සිංහයා/ ගෙම්බා/ මොණරා/ නයා (ලකුණු 01)
(vi) යැපෙන්නන් (ලකුණු 01)
(vii) මුවා/ ගවයා (ලකුණු 01)
(viii) පාරිසරික සමතුලිත බව පවත්වා ගැනීම (ලකුණු 01)

B a - මීවන b- මිරිස් ගස c - පොල්ගස d - එලයේ කටු ඇත e - මිරිස් ගස (ලකුණු 05)

07. A (i) උෂ්ණත්වය $26^0C$ වන අතර, ගිගුරුම් සහිත වැසි ඇති විය හැක වැනි සුදුසු පිළිතුරකට (ලකුණු 02)

(ii) උෂ්ණත්වය - සෙන්ටිග්‍රේට්/ සෙල්සියස් අංශක (ලකුණු 04)
වර්ෂාව - මිලිමීටර්
(iii) නායයෑම්/ ගංවතුර/ අකුණු අනතුරු ආදියෙන් ඕනෑම 02 ක් (ලකුණු 02)
(iv) සුදුසු පිළිතුරු සඳහා ලකුණු 2ක බැගින් (ලකුණු 04)

B A - ඝන ද්‍රව්‍යකට නිදසුනක්
B - ද්‍රවයකට නිදසුනක් }
C - වායුවකට නිදසුනක් (ලකුණු 03)